# ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත වර්ධනයෙහිලා සූක්ෂම ණයවල බලපෑම

එච්. එම්. එස්. ප්‍රියනාත්
එස්. කොඩිතුවක්කු

## සාරාංශය

මෙම ලිපියෙන් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත වර්ධනය කිරීමේ අරමුණින් විවිධ මූල්‍ය ආයතන මඟින් සපයන සූක්ෂම ණය, කුඩා කර්මාන්ත වර්ධනයෙහිලා කෙබඳු බලපෑමක් ඇතිකර තිබේ ද යන්න ප්‍රායෝගික ව අධ්‍යයනය කිරීම යි. ඒ සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ සහ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ක්‍රියාත්මක විවිධ මූල්‍ය ආයතනවලින් සූක්ෂම ණය ලබාගත් කුඩා කර්මාන්ත 498 ක් අතුරින් ණය සැපයූ මූල්‍ය ආයතන අනුව සහ කර්මාන්ත වර්ග අනුව සමානුපාතික ව නියෝජනය වන පරිදි සසම්භාවී ලෙස තෝරාගත් කර්මාන්ත 100 ක් ආශ්‍රයෙන් ප්‍රශ්නාවලියක් භාවිත කර දත්ත රැස් කරන ලදී. එකී දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද මඟින් විග්‍රහ කර විස්තරාත්මක ව මෙම පත්‍රිකාවෙන් ඉදිරිපත් කොට ඇත.

සූක්ෂම ණය ලබා ගත් බොහෝ කුඩා කර්මාන්තවල වර්ධනයක් ඇතිවීමට සූක්ෂම ණය දැඩි බලපෑමක් ඇති කර ඇති බහුතර කුඩා කර්මාන්ත හිමියන් පිරිසක් සූක්ෂම ණය මඟින් ස්ථාවර යෙදවුම් වැඩිකර ගෙන ඇති අතර විචල්‍ය යෙදවුම් වැඩිකර ගෙන ඇත්තේ අඩු කර්මාන්ත ප්‍රමාණයකි. සූක්ෂම ණය මුදල් භාවිත කර කර්මාන්තයේ ගොඩනැඟිලි පරිමාව වැඩිකර ගත් කුඩා කර්මාන්තවල මෙන් ම යන්ත්‍ර සූත්‍ර උපකරණ වැඩිකර ගත් කර්මාන්තවල නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. බොහෝ කුඩා කර්මාන්තවලට අවශ්‍ය අවම යෙදවුම් ප්‍රමාණය වැඩි කර ගැනීමට සූක්ෂම ණය වශයෙන් ලැබෙන මුදල ප්‍රමාණවත් නොවීම සහ ණය මුදල් කර්මාන්ත හිමියන් අනිසි ලෙස භාවිත කිරීම නිසා ණයවල සඵලතාව සීමා වී ඇත. කුඩා කර්මාන්තකරුවන් මුහුණපාන මූල්‍ය, අළෙවි, අමුද්‍රව්‍ය, නීතිරීති,

ශ්‍රමික හා වෙනත් ප්‍රශ්න මෙන් ම කර්මාන්තකරුවන්ගේ කළමනාකරණ දුර්වලතා හේතුවෙන් ද සූක්ෂම ණයවල සඵලතාව තවදුරටත් සීමා වී තිබේ.

## හැඳින්වීම

බොහෝ සංවර්ධිත මෙන් ම සංවර්ධනය වන රටවල ආර්ථික සංවර්ධනයෙහිලා කුඩා කර්මාන්ත වර්ධනයෙන් සිදුවන බලපෑම අතිමහත්ය. විශේෂයෙන් ම සංවර්ධිත රටවල සිදුවූ ශීඝ්‍ර කාර්මීකරණයට පදනම වැටී ඇත්තේ එම රටවල වර්ධනය වූ කුඩා කර්මාන්ත මඟිනි (Reddy, 1992: 2). වර්තමානයේ දී වුව ද බොහෝ සංවර්ධිත රටවල එනම් ජපානය, බ්‍රිතාන්‍ය, ඉතාලිය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, තායිවානය, දකුණු කොරියාව වැනි රටවල කාර්මීකරණයේ වැඩි වැදගත් කමක් දරනු ලබන්නේ කුඩා කර්මාන්ත මඟින් වේ (United Nations, 1995: 3). උදාහරණ ලෙස, ජපානයේ මුළු කාර්මික නිෂ්පාදනවලින් 80% ක් කුඩා කර්මාන්ත මඟින් දායක කරන අතර කාර්මික අංශයේ සේවා නියුක්තියෙන් 87. 2% කුඩා කර්මාන්ත මඟින් දායක කෙරේ (Rao, 1991:3). ඇමරිකා එක්සත් ජනපදයේ ද මුළු කර්මාන්තවලින් 81. 7% ක් කුඩා කර්මාන්ත වන අතර කාර්මික අංශයේ සේවා නියුක්තියෙන් 76. 3% ක් කුඩා කර්මාන්ත මඟින් දායක කෙරේ. එසේ ම දකුණු කොරියාවේ මුළු කර්මාන්තවලින් 96% ක් කුඩා කර්මාන්ත වන අතර කාර්මික අංශයේ සේවා නියුක්තියෙන් 86. 7%ක් කුඩා කර්මාන්ත මඟින් දායක කෙරේ (www.worldbank.org/research/msmedabase). සංවර්ධිත රටවල මෙන්ම සංවර්ධනය වන රටවල ද ආර්ථික සංවර්ධනයෙහිලා කුඩා කර්මාන්ත වැඩි වැදගත් කමක් දරනු ලැබේ. උදාහරණ ලෙස ඉන්දුනීසියාව් සහ මැලේසියාව වැනි රටවල මුළු කර්මාන්ත ප්‍රමාණයෙන් 99% ක් කුඩා කර්මාන්ත මඟින් දායක කෙරේ. එසේම පිලිපීනය, තායිලන්තය, ඉන්දියාව වැනි රටවල කර්මාන්ත අංශයේ සේවා නියුක්තියෙන් 70% ක් පමණ කුඩා කර්මාන්ත මඟින් දායක කරන අතර කාර්මික නිෂ්පාදනවලින් 80% ක් පමණ කුඩා කර්මාන්ත මඟින් දායක කරයි (www.wordbank.org/research/msmedadatabase).

සංවර්ධනය වන රටවල ආර්ථික සංවර්ධනයෙහිලා කුඩා කර්මාන්තවල කාර්යභාරය ඉතා වැදගත් ය. මක්නිසා ද කුඩා කර්මාන්ත දියුණු කිරීම මඟින් සංවර්ධනය වන රටවල පවතින ප්‍රධාන මෙන් ම සංකීර්ණ ආර්ථික ප්‍රශ්න රාශියකට ද විසඳුම් ලැබේ. කුඩා කර්මාන්ත ඉතා සරල තාක්ෂණයෙන් භාවිත කර ඉතා අඩු මූලික ප්‍රාග්ධන වත්කම් යටතේ ආරම්භ කළ හැකි බැවින් ප්‍රාග්ධනය, ඌණ සංවර්ධනය වන රටවල ආර්ථික සංවර්ධනයෙහිලා කුඩා කර්මාන්ත වැඩි වැදගත්කමක් දරනු ලැබේ. කුඩා කර්මාන්ත වර්ධනය කිරීම මඟින් සංවර්ධනය වන රටවල් මුහුණ දෙන දැඩි සේවා වියුක්ති ගැටළුවට ද පිළියම් ලැබේ. ඒවා ශ්‍රම සූක්ෂම කර්මාන්ත බැවින් මහා පරිමාණ කර්මාන්තවලට වඩා වැඩි සේවා නියුක්තියක් උත්පාදනය කරනු ලැබේ (UN Information,1994:3). කුඩා කර්මාන්ත දියුණු කිරීමෙන් රටක ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත ව පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වන අතර ග්‍රාමීය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ද භාවිත කළ හැකි ය. බොහෝ සංවර්ධනය වන රටවල දිළිඳුකම පිටුදැකීමේ උපාය මාර්ගයක් ලෙස ද කුඩා කර්මාන්ත දියුණු කිරීම හඳුනාගෙන ඇති අතර ඒවා දියුණු කිරීමෙන් රටක ආදායම් විෂමතාව අඩු කර ගත හැකි ය. කුඩා කර්මාන්ත දියුණු කර ගැනීම මඟින් ගෙවුම් ශේෂ ප්‍රශ්නයට ද විසඳුම් සැපයෙන අතර රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ද උසස් මට්ටමකට ළඟාවේ. මෙසේ කුඩා කර්මාන්ත නැංවීම මඟින් රටක සංකීර්ණ ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන අතර එමඟින් ජාතික නිෂ්පාදිතය වැඩිවී ආර්ථික සංවර්ධනය ද ඇතිවේ.

එබැවින් කුඩා කර්මාන්ත වර්ධනයෙහිලා බොහෝ සංවර්ධනය වන රටවල් විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇති අතර එකී කර්මාන්තවලට අවශ්‍ය මූල්‍ය සම්පත් සැපයීම ඒ අතර ප්‍රමුඛ වේ. කුඩා කර්මාන්ත සංවර්ධනයට ඇති ප්‍රධාන බාධකය මූල්‍ය සම්පත් හිඟය බව බොහෝ අධ්‍යයන වාර්තා හෙළි දරව් කර ඇත (Jalal, 1991: 2). කුඩා කර්මාන්තකරුවන්ට ණය හා අනෙකුත් සහන සැපයීම සඳහා බොහෝ රටවල්වල රාජ්‍ය ආයතන, මූල්‍ය අංශ,

පෞද්ගලික අංශ, සමූපකාර සංවිධාන මෑත කාලයේ වැඩි වශයෙන් දායක වී ඇත්තේ දිළිඳුකම පිටු දැකීමට සහ නිමැයුම් අංශ ශක්තිමත් කිරීමට කුඩා කර්මාන්ත වැඩි වශයෙන් දායක වන බැවිනි (Beck, 2003). බොහෝ සංවර්ධිත මෙන්ම සංවර්ධනය වන රටවල් එනම් නෙදර්ලන්තය, ඕස්ට්‍රේලියාව, මැලේසියාව, ඉන්දුනීසියාව වැනි රටවල් කුඩා කර්මාන්තකරුවන්ට ණය සැපයීමට විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. ජාත්‍යන්තර සංවිධාන විශේෂයෙන් ම ලෝක බැංකුව ලෝකයේ බොහෝ සංවර්ධනය වන රටවල කුඩා කර්මාන්ත නැංවීම සඳහා සහ ඔවුනට ණය සැපයීම සඳහා විශාල ලෙස මූල්‍ය සම්පත් යොදවා තිබේ.

ශ්‍රී ලංකාව ද නිදහසින් පසු කුඩා කර්මාන්ත නැංවීම සඳහා විවිධ කාලවල දී විවිධ උත්සාහයන් දරා තිබේ. විශේෂයෙන් ම ආනයන ආදේශන කාර්මීකරණ උපාය මාර්ග ක්‍රියාත්මක වූ 1977 ට පෙර යුගයේ රාජ්‍ය අංශය කුඩා කර්මාන්ත නැංවීම සඳහා පුහුණු උපදේශක සහ මූල්‍ය සහය සැපයූ අතර 1961 මහජන බැංකුව පිහිටුවීම 1974 දී කුඩා හා මධ්‍ය පරිමාන ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම ඒ අතර ප්‍රධාන වේ (Centra Bank of Sri Lanka. 1998 : 122).

1977 න් පසු විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ ද කුඩා කර්මාන්ත වර්ධනය කිරීම සඳහා රාජ්‍ය සහය සැපයූ අතර ඊට සමගාමී ව මූල්‍ය ආයතන ද කුඩා කර්මාන්ත නැංවීම සඳහා විවිධ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර ඇත. 1980 ජාතික සංවර්ධන බැංකුව පිහිටුවීම, 1985 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ස්ථාපිත කිරීම, 1991 න් පසු ජනසවිය වැඩ සටහන යටතේ කුඩා කර්මාන්තකරුවන් සඳහා මූල්‍ය සහ අනෙකුත් සහය සැපයීම ඒ අතර ප්‍රධාන වේ. විවිධ රාජ්‍ය ආයතන රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ සමූපකාර ආයතන කුඩා කර්මාන්තකරුවන්ට ණය සැපයීමෙන් ඒවා වර්ධනය කිරීමට කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කර ඇත. 1979 - 1996 කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ක්‍රියාත්මක කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන රුපියල්

මිලියන 12036 ක මුදලක් කුඩා කර්මාන්තකරුවන්ට සපයා ඇත (Central Bank Sri Lanka 1998 : 124). එසේම 1979 - 2000 කාලය තුළ ශ්‍රී ලංකාවේ විවිධ මූල්‍ය ආයතන කුඩා කර්මාන්තකරුවන් 1650960 ක් සඳහා රුපියල් මිලියන 18213 ක් ණය ලෙස සපයා ඇත (Charitonenka, 2002:12).

එසේම බොහෝ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන, මූල්‍ය ආයතන සහ සමුපකාර සංගම් කුඩා කර්මාන්ත නැංවීමට මූල්‍ය පහසුකම් සපයා ඇතත්, ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත කැපී පෙනෙන ලෙස වර්ධනය වී නොමැති බව විවිධ වාර්තාවලට අනුව පැහැදිලි වේ. කුඩා කර්මාන්ත දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1993 දී 1. 43% ක දායකත්වයක් දැරුව ද එය 2006 දී 1. 19% ක් ලෙස අඩු වී ඇත (Central Bank of Sri Lanka, 1995 and 2006). එසේ ම 1977 න් පසු ශ්‍රී ලංකාවේ නිමැයුම් කර්මාන්තවලට කුඩා කර්මාන්ත කරන දායකත්වය 1993 දී 7. 01% සිට 2006 වන විට 7. 48% ක් ලෙස සුළු වැඩි වීමක් පිළිබිඹු කරයි. එසේ ම පසුගිය දශක දෙකක කාලය තුළ කුඩා කර්මාන්තවල සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය 3. 6% ක් පමණ වූ අතර එය සාපේක්ෂ වශයෙන් අඩු වර්ධන අනුපාතයකි. එසේම ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත, මුළු කර්මාන්ත ප්‍රමාණයෙන් 85% ක් දායක කළ ද කර්මාන්ත අංශයේ මුළු සේවා නියුක්තියෙන් කුඩා කර්මාන්ත දායක කරනුයේ 18. 7% ක් වැනි අඩු ප්‍රතිශතයකි. තව ද කුඩා කර්මාන්ත මඟින් කර්මාන්ත අංශයේ මුළු එකතු කළ අගයට දායක කරනු ලබන්නේ 4. 9% ක් වැනි අඩු ප්‍රමාණයකි (Abeyratne, 2005:7).

මෙසේ ශ්‍රී ලංකාවේ විවිධ ආයතන හා මූල්‍ය අංශ කුඩා කර්මාන්ත නැංවීමේ අපේක්ෂාවෙන් සූක්ෂම ණය සපයා ඇතත්, කුඩා කර්මාන්ත අංශයේ සිදුවී ඇත්තේ මන්දගාමී වර්ධනයකි. එබැවින් මෙම අධ්‍යයනය මඟින් උත්සාහ දරා ඇත්තේ ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන මඟින් කුඩා කර්මාන්තවලට සපයා ඇති සූක්ෂම ණය කොතෙක් දුරට එම කර්මාන්තවල වර්ධනයට බලපා තිබේ ද යන්න අධ්‍යයනය කිරීම යි.

## අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්තවලට සපයා ඇති සූක්ෂම ණය කොතෙක් දුරට එම කර්මාන්තවල වර්ධනයට බලපා තිබේ ද යන්න අධ්‍යයනය කිරීම යි.

මෙම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු වන්නේ,

අ. කුඩා කර්මාන්තවල ස්ථාවර හා විචල්‍ය යෙදවුම් වැඩිවීමට සූක්ෂම ණයවල බලපෑම අධ්‍යයනය කිරීම.

ආ. කුඩා කර්මාන්තවල යෙදවුම් වැඩිවීම නිමැවුම් වැඩිවීමට කර ඇති බලපෑම අධ්‍යයනය කිරීම.

ඇ. කුඩා කර්මාන්ත වර්ධනයෙහිලා සූක්ෂම ණයවල බලපෑම සීමා කරන සාධක හඳුනා ගැනීම.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය බොහෝ සෙයින් රඳා පවතින්නේ ප්‍රාථමික දත්ත මත වේ. ඒ සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ බළන්ගොඩ සහ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි කුඩා කර්මාන්ත කරුවන් ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. 2000 - 2004 කාලය තුළ සමෘද්ධි බැංකුව සහ සමුපකාර ග්‍රාමීය බැංකුව යන මූල්‍ය ආයතනවලින් කුඩා කර්මාන්ත සඳහා ණය ලබා ගත් 498 ක් වූ පිරිසකගෙන් 100 ක් සරළ සසම්භාවී ලෙස තෝරා ගත් අතර විවිධ කර්මාන්ත වර්ග අනුව සමානුපාතික නියෝජනයක් ලැබෙන පරිදි නියැඳිය සඳහා කර්මාන්ත තෝරා ගනු ලැබිණි. තෝරාගත් බැංකු, විවිධ අංශ සඳහා ව්‍යාපාරික ණය සපයා තිබුණ ද මෙම අධ්‍යයනයේ දී කර්මාන්ත වර්ග කරනු ලැබුවේ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව වර්ග කරන ලද ද්වි අංක නිමැයුම් කර්මාන්තවලට අයත් කර්මාන්ත වන අතර කුඩා කර්මාන්තයක් යන්න ශ්‍රමිකයින් 25 කට අඩු කර්මාන්ත කුඩා කර්මාන්තයක් ලෙස නිර්වචනය කෙරේ. ඉහත වර්ගීකරණයට හා නිර්වචනයට අයත් බළන්ගොඩ සහ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉහත බැංකුවලින් සූක්ෂම ණය ලබාගත් කර්මාන්තකරුවන් සහ නියැඳිය 01 වන වගුවෙන් දැක්වේ.

01 වන වගුව : සංගහණය සහ නියැදිය

| බැංකු | සූක්ෂම ණය ලබාගත් කුඩා කර්මාන්ත | නියැදිය (මුළු ප්‍රමාණයෙන් 16 7%) |
|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව | 153 | 26 |
| සමෘද්ධි බැංකුව | 293 | 49 |
| සමුපකාර ග්‍රාමීය බැංකුව | 152 | 25 |
| එකතුව | 498 | 100 |

සමෘද්ධි බැංකු සංගමය 2000 - 2003 කාලය තුළ වැඩි වශයෙන් කුඩා කර්මාන්ත සඳහා ණය සපයා ඇති බැවින් නියැදියේ වැඩි නියෝජනයක් සමෘද්ධි බැංකුවෙන් ණය ලබා ගත් කුඩා කර්මාන්ත කරුවන්ට හිමි ව පවතී.

කුඩා කර්මාන්තකරුවන් ලබාගත් සූක්ෂම ණය කර්මාන්තයේ දියුණුවට කෙසේ යොදවා ඇද්ද යන්න පිළිබඳ ව කුඩා කර්මාන්ත කරුවන්ගෙන් තොරතුරු ලබා ගැනීමේ දී ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිත කළ අතර පර්යේෂකයින් විසින් කර්මාන්ත හිමිකරුවන් සමඟ සාකච්ඡා කරමින් ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා ගන්නා ලදී. ඊට අමතර ව කර්මාන්තවල කටයුතු නිරීක්ෂණය කිරීම මඟින් ඇතැම් තොරතුරු ලබා ගත් අතර ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ක්‍රමවේද භාවිත කර දත්ත විග්‍රහ කර විස්තරාත්මක ව ඉදිරිපත් කර ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ප්‍රකට ආර්ථික විද්‍යා න්‍යායක් වන නිෂ්පාදන න්‍යායේ මූලික වශයෙන් සාකච්ඡා කරනුයේ නිමැවුම සහ යෙදවුම් අතර සබඳතාව යි. නිෂ්පාදන ආයතනයක නිමැවුම තීරණය වන්නේ යෙදවුම් මතයි. යෙදවුම් ස්ථාවර හා විචල්‍ය යෙදවුම් ලෙස පුළුල් ව වර්ග කරන අතර යෙදවුම් වැඩි කිරීම නිමැවුම කෙරෙහි බලපෑම් ඇති කරයි. නිෂ්පාදනයේ කෙටි කාලයේ දී එනම් ස්ථාවර සාධක

වෙනස් නොකර විචල්‍ය සාධක පමණක් වැඩි කිරීමේ දී කර්මාන්තයේ නිමැවුම එක්තරා අවස්ථාවක් දක්වා වැඩි වී පසුව අඩුවන බව නිෂ්පාදන න්‍යායේ දැක්වේ. එසේම නිෂ්පාදනයේ දිගු කාලයේ දී ස්ථාවර යෙදවුම් සහ විචල්‍ය යෙදවුම් යන දෙවර්ගය ම එකවර වැඩි කිරීමේ දී යම් කර්මාන්තයක අභ්‍යන්තර හා බාහිර පිරිමැසුම් වැඩි වේ නම් නිමැවුම වැඩි වේගයකින් වැඩි වන බව ද වූ එම න්‍යායේ දැක්වේ. යම් කර්මාන්තයක යෙදවුම් වැඩි කිරීම නිමැවුම වැඩි වීමට හේතුවන අතර වැඩි වන නිමැවුමේ තරම වූ තීරණය වන්නේ විවිධ හෙතු මත වේ.

මෙම අධ්‍යයනය මඟින් උත්සාහ දරණුයේ සූක්ෂම ණය ලබාගත් කුඩා කර්මාන්තකරුවන් සිය ණය මුදල් මූලික වශයෙන් වැය කර වර්ධනය කර ගන්නා ලද යෙදවුම් එම කර්මාන්තවල නිමැවුම් වර්ධනයවීම කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කර තිබේ ද යන්න සොයා බැලීම යි. අධ්‍යයනයට භාජනය කළ කුඩා කර්මාන්තහිමියන් සූක්ෂම ණය ලබාගෙන ඇත්තේ සිය කර්මාන්තයේ ස්ථාවර සහ විචල්‍ය යෙදවුම් වැඩිකර ගැනීමේ අරමුණින් ය. 02 වන වගුවෙහි දැක්වෙන පරිදි වැඩි කුඩා කර්මාන්තහිමියන් පිරිසක් ණය ලබා ගැනීමේ ප්‍රධානතම අරමුණ ලෙස දක්වා ඇත්තේ ස්ථාවර යෙදවුම් වැඩිකර ගැනීමයි. නියැදියේ 34% ක කර්මාන්තකරුවන් පිරිසක් ණය ලබා ගැනීමේ ප්‍රධානතම අරමුණ ලෙස දැක්වූයේ කර්මාන්තයේ ගොඩනැඟිලි තත්ත්වය දියුණු කර ගැනීම යි. කුඩා කර්මාන්ත කරුවන් 32% සූක්ෂම ණය ලබාගෙන ඇත්තේ යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලට ගැනීමට යි. 29% කුඩා කර්මාන්තකරුවන් ණය ලබා ගැනීමේ ප්‍රධාන අරමුණු ලෙස දැක්වූයේ කර්මාන්තයට අවශ්‍ය විචල්‍ය යෙදවුම් එනම් අමුද්‍රව්‍ය මිලට ගැනීම යි. 05% ක් කර්මාන්ත කරුවන් වෙනත් යෙදවුම් යටිතල පහසුකම් වැඩි කර ගැනීමට ණය මුදල් භාවිත කර ඇත.

### 02 වන වගුව: කුඩා කර්මාන්තකරුවන් සූක්ෂම ණය ඉල්ලුම් කිරීමේ ප්‍රධානතම අරමුණ

| ප්‍රධාන ණය අරමුණ | එකතුව (%) |
|---|---|
| ● කර්මාන්තයේ ගොඩනැගිලි තත්ත්වය වැඩි දියුණු කර ගැනීම | 34% |
| ● කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිල දී ගැනීම | 32% |
| ● කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලට ගැනීම | 29% |
| ● වෙනත් යෙදවුම් වැඩිකර ගැනීම | 05% |

## ස්ථාවර යෙදවුම් වැඩි කර ගැනීම කෙරෙහි සූක්ෂම ණය වල බලපෑම

ස්ථාවර යෙදවුම් යනු කෙටිකාලයක දී වෙනස් කළ නොහැකි කෙටි කාලීන නිෂ්පාදනයේ දී නිමැවුම වැඩි කළත් වැඩි නොවී ස්ථාවර ව පවතින ඉඩම් ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර වැනි යෙදවුම් වේ. නියැදියේ බහුතරයක් වූ කුඩා කර්මාන්තකරුවන් සූක්ෂම ණය ඉල්ලුම්කර ඇත්තේ ස්ථාවර යෙදවුම් වැඩිකර ගැනීමට සඳහා ය.

## ගොඩනැගිලි තත්ත්වය දියුණු වීම

ඉහත 02 වන වගුවේ දැක්වෙන පරිදි 34% ක් වූ කර්මාන්ත කරුවන් පිරිසක් සූක්ෂම ණය ලබාගෙන ඇත්තේ කර්මාන්තයේ ගොඩනැගිලි තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට යි. එයින් කර්මාන්තකරුවන් 24 ක් (70. 6%) සූක්ෂම ණය ලබාගෙන ඇත්තේ පවත්නා ගොඩනැගිල්ල අලුත්වැඩියා කර ගැනීමේ අරමුණින් ය. කුඩා කර්මාන්තකරුවන් 8 දෙනෙක් ණය ලබාගෙන ඇත්තේ නව ගොඩනැගිලි ඉදිකරගැනීමට වන අතර කුඩා කර්මාන්තකරුවන් 2ක් ණය ලබාගෙන ඇත්තේ ගොඩනැගිලි කුලියට ලබා ගැනීම සඳහා ය.

කුඩා කර්මාන්තවල ගොඩනැඟිලි තත්ත්වය දියුණුවීමට ලබාගත් ණය මුදල එතරම් බලපෑමක් සිදුකර නොමැති බව 3 වන වගුවෙන් පැහැදිලි වේ. කුඩා කර්මාන්තවල ගොඩනැඟිලි තත්ත්වය වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් සූක්ෂම ණය ලබා ගත් පිරිසෙන් 61. 8% ක වූ කර්මාන්තකරුවන්ගේ ගොඩනැඟිලි තත්ත්වය දියුණුවීම කෙරෙහි සූක්ෂම ණය මුදල බලපා ඇත්තේ ඉතා අඩු ලෙසිනි.

බහුතර කර්මාන්ත ප්‍රමාණයකට ලබාගත් ණය මුදල්වලින් ගොඩනැඟිලි තත්ත්වය වර්ධනය කර ගැනීමට හැකි වී නැත. කුඩා කර්මාන්තවල ගොඩනැඟිලි තත්ත්වය සාමාන්‍ය තරමින් වර්ධනය කර ගැනීමට සූක්ෂම ණය මුදල් ප්‍රමාණවත් වී ඇත්තේ ගොඩනැඟිලි වැඩි දියුණු කර ගැනීමට ණය ලබාගත් කර්මාන්ත කරුවන්ගෙන් 29. 4% කට වේ. 8. 8% වූ කුඩා කර්මාන්තකරුවන් පිරිසකට ලබාගත් ණය මුදල සිය ගොඩනැඟිලි තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට වැඩි ලෙස බලපා ඇත.

3 වන වගුව : ගොඩනැඟිලි තත්ත්වය දියුණුවීම කෙරෙහි ණය මුදල්වල බලපෑම

| | ප්‍රමාණය | % |
|---|---|---|
| වැඩි ලෙස | 03 | 8 8 |
| සාමාන්‍ය ලෙස | 10 | 29 4 |
| අඩු ලෙස | 21 | 61 8 |
| එකතුව | 34 | 100 |

කුඩා කර්මාන්තවල ගොඩනැඟිලි තත්ත්වය වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් ණය ලබා ගත් කර්මාන්තකරුවන් බහුතරයකගේ ගොඩනැඟිලි තත්ත්වය වර්ධනය කර ගැනීමට සූක්ෂම ණය බලපා නැත්තේ ප්‍රමාණවත් ණය මුදලක් සූක්ෂම ණය ලෙස ඔවුනට ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙනි. අතළොස්සක් වූ කුඩා කර්මාන්තහිමියන් පිරිසක් ණය මුදල් සමඟ සිය පෞද්ගලික මුදල් ද භාවිත කර කර්මාන්තයට අවශ්‍ය පරිදි ගොඩනැඟිලි තත්ත්වය දියුණු කරගෙන ඇත. ණය ලබා ගත් ඇතැම් කර්මාන්තකරුවන්ගේ ගොඩනැඟිලි ඉදිකිරීමේ කටයුතු අතර මඟ නැවතී ඇති අතර එම ගොඩනැඟිලි නිෂ්පාදන කාර්යයට මෙතෙක් භාවිත කර නොමැත.

ගොඩනැඟිලි තත්ත්වය දියුණු කර ගැනීමට ඇස්තමේන්තුගත මුදල් සූක්ෂම ණය වශයෙන් නොලැබීම සහ ප්‍රමාණවත් ණය මුදලක් සූක්ෂම ණය වශයෙන් ලබා ගත නොහැකිවීම ඊට හේතු ලෙස දැක්විය හැකිය. ගොඩනැඟිලි ද්‍රව්‍ය මිල ඉහළ යෑම සහ ශ්‍රම පිරිවැය වැඩිවීම නිසා ලබාගත් ණය මුදලින් අපේක්ෂිත ඉලක්ක සපුරාගත නොහැකි වීමෙන් ගොඩනැඟිලි තත්ත්වය වැඩි දියුණු වී නොමැත. තව ද ඇතැම් කර්මාන්තහිමියන් ගොඩනැඟිලි තත්ත්වය දියුණු කර ගැනීමේ අරමුණින් ණය ලබාගෙන තිබුණත් ඔවුන් එම ණය මුදලින් ඉතා සුළු කොටසක් ගොඩනැඟිලි වර්ධනයට භාවිත කර ඉතිරි මුදල් කර්මාන්තයේ හෝ පෞද්ගලික අවශ්‍යතා සඳහා භාවිත කර ඇති බව නිරීක්ෂණය විය. එබැවින් ණය මුදලේ සඵලතාව සීමා වී ඇති අතර කුඩා කර්මාන්තවල භාණ්ඩ නිෂ්පාදනය වැඩි වීමට ගොඩනැඟිලි තත්ත්වය වර්ධනය වීම වැඩි බලපෑමක් සිදුකර නොමැත. ගොඩනැඟිලි තත්ත්වය දියුණුවීම කුඩා කර්මාන්තවල නිෂ්පාදනය වැඩි වීමට සෘජු බලපෑමක් සිදුකර නොමැති බව 04 වන වගුවෙන් පැහැදිලි වේ.

ලබාගත් ණය මුදලින් ගොඩනැඟිලි දියුණු නොවීම සහ නිෂ්පාදනය සඳහා එකී ගොඩනැඟිලි භාවිත නොකිරීම ඊට හේතු ලෙස දැක්විය හැකිය. තව ද පවත්නා ගොඩනැඟිලි වැඩි දියුණු කිරීමට බහුතර කර්මාන්තකරුවන් උත්සාහ දරා ඇති අතර එම නිසා බොහෝ කර්මාන්තවල ඉඩකඩ පරිමාවේ වෙනසක් සිදුවී නොමැති එම නිසා එකී කර්මාන්තවල ගොඩනැගලි තත්ත්වය වැඩි දියුණු වුවත් පවත්නා නිෂ්පාදනයේ කිසිඳු වෙනසක් සිදුවී නොමැත.

**04 වන වගුව: ගොඩනැඟිලි තත්ත්වය දියුණුවීම, නිෂ්පාදනය වැඩිවීම කෙරෙහි බලපෑම**

| | *ප්‍රමාණය* | *%* |
|---|---|---|
| වැඩි ලෙස බලපා ඇත | 05 | 14 7 |
| සාමාන්‍ය ලෙස බලපා ඇත | 10 | 29 4 |
| අඩු ලෙස බලපා ඇත | 10 | 26 5 |
| එකතුව | 34 | 100 |

අනෙක් අතට 14. 7% වූ කුඩා කර්මාන්ත ප්‍රමාණයක නිෂ්පාදනය වැඩිවීම කෙරෙහි ගොඩනැඟිලි තත්ත්වය දියුණුවීම බලපා ඇත්තේ ණය මුදල් ලබාගෙන එකී කර්මාන්තයන්හි ගොඩනැඟිලිවල ඉඩකඩ පරිමාව පුළුල් කරගත් කර්මාන්තවල පමණි. ණය මුදල් භාවිත කර පෙරට වඩා වැඩි ඉඩකඩ ප්‍රමාණයක් ලබාගත හැකි පරිදි කර්මාන්තයේ ගොඩනැඟිලි දියුණු කරගත් කර්මාන්තවල නිෂ්පාදනය වැඩි ලෙස හෝ සාමාන්‍ය ලෙස වැඩි වී ඇත. නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත්වීම වැඩි යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණයක් භාවිත කිරීමට හැකිවීම, ගබඩා පහසුකම් වැඩිවීම වැනි හේතු නිසා එකී කර්මාන්තවල නිෂ්පාදනය වැඩිවී ඇති අතර එම කර්මාන්ත පරිමාණානුකූල වාසි අත්කරගෙන ඇත.

## යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලට ගැනීම

කුඩා කර්මාන්තකරුවන් 32% ක පිරිසක් ණය ලබාගෙන ඇත්තේ සිය කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීමට වේ. ඉන් 31. 2% ක පිරිසකට ලබාගත් ණය මුදල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිල දී ගැනීමට ප්‍රමාණවත් වී ඇති අතර 46. 9 % කට සාමාන්‍ය වශයෙන් ප්‍රමාණවත් වී ඇත. ණය මුදල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිල දී ගැනීමට ප්‍රමාණවත් වී නැත්තේ 29. 9% ක කර්මාන්තකරුවන් පිරිසකට ය. බොහෝ කුඩා කර්මාන්ත ප්‍රමාණයකට අවශ්‍ය අවම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිල දී ගැනීමට, ලබා ගත් ණය මුදල ප්‍රමාණවත් වී ඇති අතර ඇඟළුම් කර්මාන්තවලට අවශ්‍ය මහත මැෂින් මිලට ගැනීමට, දැව සහ ගෘහ භාණ්ඩ නිෂ්පාදකයින්ට රවුටර් මැෂින්, ඩ්‍රිල් මැෂින් වැනි විදුලි උපකරණ හා අනෙකුත් අවශ්‍ය සරල උපකරණ මිල දී ගැනීමට ලබාගත් ණය මුදල ප්‍රමාණවත් වී නැත. විශේෂයෙන් මිල අධික යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය බේකරි, ලියවන පට්ටල්, ඇඹරුම් හල්, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, යකඩ ආශ්‍රිත නිෂ්පාදනවල නියැලී සිටින කර්මාන්තකරුවන්ට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීමට ණය මුදල ප්‍රමාණවත් වී නැත. උදාහරණ ලෙස කම්හල් කටයුතුවල නිරත ව ඇති කර්මාන්තවලට අවම වශයෙන් රුපියල් ලක්ෂ 3 ක පමණ මුදලක් අවශ්‍ය අවම යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිල දී ගැනීමට අවශ්‍ය වුවත් සූක්ෂම ණය ලෙස ලබා ගැනීමට හැකි වී ඇත්තේ රුපියල් 20, 000 ක මුදලකි.

ණය මුදල් භාවිත කර යන්ත්‍ර සූත්‍ර මිලට ගත් කර්මාන්තකරුවන් බහුතරයකගේ භාණ්ඩ නිෂ්පාදනය වර්ධනය වී ඇති බව 05 වන වගුවෙන් පිළිබිඹු වේ.

**05 වන වගුව : භාණ්ඩ නිෂ්පාදනය වැඩිවීම කෙරෙහි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වැඩිවීමේ බලපෑම**

| | ප්‍රමාණය | % |
|---|---|---|
| වැඩි ලෙස | 8 | 25 |
| සාමාන්‍ය ලෙස | 17 | 53 |
| අඩු ලෙස | 7 | 22 |
| එකතුව | 32 | 100 |

යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලට ගැනීමට ණය ලබාගත් කර්මාන්ත කරුවන් බහුතරයකගේ මාසික නිෂ්පාදනය වැඩි වීමට මිලට ගත් යන්ත්‍ර සූත්‍ර බලපා තිබේ. ඉන් 25% ක් වූ පිරිසකට නිෂ්පාදනය වැඩි වීමට යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වැඩි ලෙස බලපා ඇති අතර 53% ක පිරිසකට සාමාන්‍ය ලෙස බලපා තිබේ. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වැඩි වීම නිසා නිෂ්පාදන කාර්යක්ෂම බව හා වේගය වැඩි වීම මෙන්ම නිෂ්පාදනවල ගුණත්වය වැඩි වීම නිසා ද නිෂ්පාදනය වැඩි වූ බව කර්මාන්තහිමියන්ගේ මතය විය. එම නිසා පෙරට වඩා ඇණවුම් ප්‍රමාණයක් භාරගෙන ඒවා කඩිනමින් පාරිභෝගිකයින්ට සැපයීමට බොහෝ කර්මාන්තහිමියන් පිරිසකට හැකි වී ඇති අතර වෙළඳ පොළට හිඟයකින් තොරව භාණ්ඩ සැපයීමට ද ඇතැම් නිෂ්පාදකයින්ට හැකි වී ඇත.

## වෙනත් ස්ථාවර යෙදවුම් වැඩිකර ගැනීම

නියැදියේ ඉතා සුළු කර්මාන්තකරුවන් පිරිසක් එනම් 5% ක් සූක්ෂම ණය ලබා ඇත්තේ රථවාහන මිලට ගැනීමට සහ කර්මාන්තයට අවශ්‍ය විදුලි බලය ලබා ගැනීමට වේ. කර්මාන්තයේ ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ත්‍රී විලර් හා මෝටර් බයිසිකල් මිල දී ගැනීමට නියැදියෙන් 4% ක පිරිසක් ණය මුදල්

වැය කර ඇති අතර එක් කර්මාන්තකරුවෙක් විදුලි බලය ලබා ගැනීමට ණය මුදල් වැය කර ඇත. තමා සතු පෞද්ගලික මුදල්වලට අමතර ව ණය මුදල ද භාවිත කර රථවාහන හා විදුලිය ලබා ගෙන තිබීම විශේෂ ලක්ෂණයකි. රථවාහන වැඩිවීම එම කර්මාන්තවල නිෂ්පාදනය වැඩි වීමට සාමාන්‍ය ලෙස බලපා ඇති බව කර්මාන්තහිමියන්ගේ මතය වේ. අඩු පිරිවැයකින් කලට වේලාවට යෙදවුම් ප්‍රවාහනය කර ගැනීමේ හැකියාව වැඩිවීම, නව වෙළඳපොල සොයා ගැනීමට හැකිවීම, කලට වෙලාවට, භාණ්ඩ වෙළඳපොලට සැපයීමට හැකිවීම ඊට හේතු ලෙස දැක්වීය. එසේම විදුලිය ලබාගත් කර්මාන්තහිමියාගේ භාණ්ඩ නිෂ්පාදනය වැඩිවීමට විදුලි බලය ලබා ගැනීම ඍජු ලෙස බලපා තිබේ. මෙසේ ස්ථාවර සාධක වැඩි කරගත් කර්මාන්තකරුවන් බහුතරයකගේ නිෂ්පාදනය වැඩි වීමට ලබාගත් ණය මුදල බලපා තිබේ.

## විචල්‍ය යෙදවුම් වැඩිවීම කෙරෙහි සූක්ෂම ණයවල බලපෑම

විචල්‍ය යෙදවුම් යනු භාණ්ඩ නිෂ්පාදනය සමඟ වෙනස් වන අමුද්‍රව්‍ය, ශ්‍රමය වැනි කෙටි කාලයක දී වෙනස් කළ හැකි යෙදවුම්' වේ. කර්මාන්තයක නිෂ්පාදනය වැඩි කර ගැනීමේ දී පහසුවෙන් වෙනස් කළ හැකි යෙදවුම් වන්නේ ද විචල්‍ය යෙදවුම් ය. අධ්‍යයනයට භාජනය කළ කර්මාන්ත අතරින් කර්මාන්ත 29 ක් පමණක් විචල්‍ය යෙදවුම් වැඩිකර ගැනීමට ණය ලබාගෙන ඇති අතර ඒ සියල්ල ම ණය මුදල් වැයකර ඇත්තේ කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ය.

## අමුද්‍රව්‍ය මිල දී ගැනීම

අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ණය ලබාගත් බහුතර කර්මාන්ත කරුවන් පිරිසකට (62. 1%) අමුද්‍රව්‍ය මිල දී ගැනීමට එකී ණය මුදල වැඩි ලෙස බලපා ඇති අතර 37. 9 %ක් වූ පිරිසකට සාමාන්‍ය ලෙස බලපා ඇත. පවතින පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නිෂ්පාදනක් කිරීමට නොහැකි වූ බොහෝ කර්මාන්ත කරුවන් අමුද්‍රව්‍ය මිලට ගැනීමට ණය ලබාගෙන තිබීම විශේෂිත ය. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන (සිමෙන්ති ගඩොල්) ඇඟළුම්

කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් දැව ආශ්‍රිත කර්මාන්ත කරුවන් (ගෘහ උපකරණ පසාරු කැටයම්) ආහාර නිෂ්පාදකයින්, සකස් කළ ලෝහ ආශ්‍රිත නිෂ්පාදකයින් (ග්‍රිල් වැඩ) භාණ්ඩ ඇණවුම් ලබාගෙන ඒවා සැපයීමට වැඩි අමුද්‍රව්‍ය ප්‍රමාණයක් එකවර අවශ්‍ය බැවින් ණය ලබාගෙන ඒවා නිෂ්පාදනය කර ඇත. එබැවින් අමුද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ණය ලබාගත් බහුතරයකගේ භාණ්ඩ නිෂ්පාදනය වැඩි වී ඇත.

තවද අමුද්‍රව්‍ය මිල අඩු හා සැපයුම වැඩි කාලවල දී ඒවා වැඩි පුර රැස්කර ගැනීමට මුදල් අවශ්‍ය වූ කර්මාන්තකරුවන් ණය ලබාගෙන අමුද්‍රව්‍ය රැස් කරගෙන ඇත. උදාහරණ ලෙස සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදකයින් වැලි තොග රැස්කර ගැනීම, දැව ආශ්‍රිත නිෂ්පාදකයින් දැව අඩු මිලට ලැබෙන විට දැව තොග මිල දී ගැනීම දැක්විය හැකි ය. එසේම ඇඟළුම් කර්මාන්තවල නියැලී සිටින කර්මාන්තකරුවෝ කොළඹ, මහරගම වැනි ප්‍රදේශවලින් එකවර අමුද්‍රව්‍ය තොග මිලට ගෙන ප්‍රවාහනය කිරීමෙන් මහා පරිමාණ මිලදී ගැනීමේ වාසි අත්කර ගැනීමට (පරිමාණානුකූල වාසි) ණය ලබාගෙන අමුද්‍රව්‍ය තොග මිලට ගැනිමට පෙළඹී සිටිති.

මෙසේ අමුද්‍රව්‍ය තොග රැස් කර ගැනිම හේතුවෙන් හිඟයකින් තොරව කලට වෙලාවට පාරිභෝගිකයින්ට භාණ්ඩ සැපයීමට නිෂ්පාදකයින්ට හැකි වී ඇති අතර වැඩි පාරිභෝගික විශ්වාසයක් ද දිනා ගැනීමට ඔවුනට හැකි වී ඇති බැවින් භාණ්ඩ නිෂ්පාදනය වැඩි වී ඇති බව ඔවුන්ගේ මතය යි. එකී බොහෝ කර්මාන්තවල නිෂ්පාදිත භාණ්ඩ ප්‍රමාණය ණය ලබා ගැනීමට පෙර පැවති භාණ්ඩ ප්‍රමාණයට වඩා වැඩි වී ඇත.

### සූක්ෂම ණයවල සමස්ත බලපෑම

බොහෝ කුඩා කර්මාන්ත ණය ලබා ගැනීමේ ප්‍රධාන අරමුණ ලෙස යම් යෙදවුමක් වැඩි කර ගැනීම ණය අයදුම් පත්‍රයේ සඳහන් කළ ද බොහෝ පිරිසක් එකී ණය මුදල් කර්මාන්තයේ විවිධ යෙදවුම් වැඩි කර ගැනීමට භාවිත කර ඇත. ණය ලබා ගැනීමෙන් පසු කුඩා කර්මාන්තවල සිදුවී ඇති ප්‍රධාන වෙනස්කම් පිළිබඳ ව ප්‍රශ්නාවලියෙන් තොරතුරු ලබාගත් අතර පහත සඳහන් විශේෂ කරුණු ඉන් පිළිබිඹු විය. නියැදියේ මුළු කර්මාන්ත ප්‍රමාණයෙන්

53%ක භාණ්ඩ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි වීම කෙරෙහි සූක්ෂම ණය බලපා තිබේ. ණය ලබා ගැනීමෙන් පසු කර්මාන්තයේ යෙදවුම්වල සිදු වූ වර්ධනය එයට හේතුව යි. විශේෂයෙන් ම ණය මුදල් හේතුවෙන් ඇතැම් කර්මාන්තයන්හි ගොඩනැගිලිවල ඉඩකඩ පරිමාව වැඩි වීම යන්ත්‍ර සූත්‍ර උපකරණ වැඩි වීම හා අමුද්‍රව්‍ය සැපයුම වැඩි වීම ආදිය නිසා කර්මාන්තවල නිෂ්පාදනය වැඩි වී ඇති එබැවින් සූක්ෂම ණය බහුතර කර්මාන්ත ප්‍රමාණයක නිෂ්පාදන වර්ධනයට හේතු වී ඇත.

ණය ලබා ගැනීමෙන් පසු අලෙවි කරන භාණ්ඩ ඒකක ප්‍රමාණය වැඩිකර ගත් කුඩා කර්මාන්ත ප්‍රමාණය 37%කි. එකී කර්මාන්තවල භාණ්ඩ අලෙවි ප්‍රමාණය වැඩි වීම කෙරෙහි බලපෑ කරුණු කිහිපයකි. ණය ලබා ගැනීමෙන් පසු ගොඩනැගිලි තත්ත්වය දියුණුවීම, තොග රැස්කර ගැනීමේ හැකියාව වැඩි වීම, යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩි වීම සහ අමුද්‍රව්‍ය හිඟයකින් තොර ව නිෂ්පාදනයට භාවිත කිරීමේ හැකියාව වැඩි වීම, වැඩි ඇණවුම් ප්‍රමාණයක් භාරගෙන කලට වේලාවට භාණ්ඩ වෙළඳපොළට සැපයීමට හැකි වීම, පාරිභෝගික විශ්වාසය හා කීර්තිනාමය ඇති කර ගැනීමට හැකිවීම ආදිය නිසා එකී කර්මාන්තවල වෙළඳපොල කොටස දියුණු වී ඇත.

අධ්‍යයනයට භාජනය කළ කර්මාන්තවලින් 76% ක සේවා නියුක්තිය පුද්ගලයින් 4කට අඩු ය. ශ්‍රමිකයින් 5 - 9 අතර සේවා නියුක්තියක් ජනනය කළ කර්මාන්ත ප්‍රමාණය 17% ක් වන අතර කර්මාන්ත 07 ක සේවා නියුක්ත පිරිස පුද්ගලයින් 10 ට වැඩිය. ණය ලබා ගැනීමෙන් පසු බොහෝ කර්මාන්තවල වැටුප් ලබන ශ්‍රමිකයින් ප්‍රමාණය වැඩි වී නැත.

ණය ලබාගැනීමෙන් පසු පවුලේ සාමාජික නොවන දෛනික/මාසික වැටුප් ලබන ශ්‍රමිකයින් කුඩා කර්මාන්තවල වැඩි වී ඇත්තේ මුළු කර්මාන්තවලින් 21%ක පමණි. ඉතිරි 79%ක් වූ කර්මාන්තවල දෛනික/මාසික වැටුප් ලබන ශ්‍රමිකයින් වැඩි වී නැති අතර බොහෝ කර්මාන්තවල සේවා නියුක්තිය පවුලේ සාමාජික පිරිසට සීමා වී ඇත. ණය ලබා ගැනීමෙන් පසු සේවා නියුක්තිය වැඩි වී ඇත්තේ සාපේක්ෂ වශයෙන් ශ්‍රමය වැඩි ලෙස භාවිත කරන ඇඟළුම් කර්මාන්ත, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ආදියෙහි වේ. ණය මුදල් ලබා ගැනීමෙන් පසු කුඩා

කර්මාන්ත බහුතරයක නිෂ්පාදනය වැඩි වුවත් සේවා නියුක්තිය වැඩි නොවීමෙන් පැහැදිලි වනුයේ එකී කර්මාන්තවල අභ්‍යන්තර කාර්යක්ෂමතාව වැඩි වී ඇති බව යි.

ණය ලබා ගැනීමෙන් පසු කුඩා කර්මාන්ත 42% ක ලාභය වැඩි වූ බව කර්මාන්තහිමියෝ පෙන්වා දුන්හ. මාසික සහ වාර්ෂික ලාභ විධිමත් ලෙස බහුතර කර්මාන්ත හිමියන් ගණනය නොකලත් ණය ගැනීමෙන් පසු කර්මාන්තයේ සිදු වූ විවිධ වෙනස්කම් හේතුවෙන් සිය ලාභය සැලකිය යුතු ලෙස වැඩි වූ බව ඇතැම් කර්මාන්ත කරුවන්ගේ අදහස විය. අළෙවි කරන භාණ්ඩ ඒකක ප්‍රමාණය වැඩි වීම ලාභය වැඩි වීමට ප්‍රධාන හේතුව බව ඔවුහු දැක්වූහ.

## ණයවල සඵලතාව සීමාවීම

සූක්ෂම ණය ලෙස ණය මුදල් නිර්වචනය කරනුයේ රුපියල් 50000/- ට අඩු ණය වේ. බොහෝ කුඩා කර්මාන්තවලට එවැනි ණය මුදලක් ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන් ගොඩනැගිලි තත්ත්වය දියුණු කිරීමට ඇතැම් කර්මාන්තවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීමට විවිධ අමුද්‍රව්‍ය තොග මිලට ගැනීමට සූක්ෂම ණය වශයෙන් ලැබෙන ණය මුදල ප්‍රමාණවත් නැති බව බොහෝ කර්මාන්තහිමියන්ගේ මතය විය. කර්මාන්තකරුවන්ගෙන් 60% කට ලැබී ඇත්තේ රුඃ 30000/- කට වඩා අඩු ණය මුදලකි. සමුපකාර ග්‍රාමීය බැංකුව හා සමෘද්ධි බැංකුව පළමු වතාවට ණය ලබා ගන්නා කර්මාන්තහිමියන්ට සපයනුයේ රුඃ 10000/- ක් වැනි ඉතා අඩු ණය මුදලකි. එම ණය මුදල සාර්ථක ව ගෙවා අවසන් කරන කර්මාන්තකරුවන්ට දෙවනුව පෙරට වඩා වැඩි ණය මුදලක් ලබාගත හැකි ය.

ප්‍රමාණවත් ණය මුදලක් කර්මාන්තකරුවන්ට නොලැබීම නිසා ණයවල ප්‍රයෝජනවත් භාවය අඩු වී ඇත. උදාහරණ ලෙස ගොඩනැගිලි තත්ත්වය දියුණු කර ගැනීමට ඇස්තමේන්තු ගත මුදල නොලැබීම නිසා ඇතැම් කර්මාන්තවල ගොඩනැගිලි මෙතෙක් සිය නිෂ්පාදනය සඳහා භාවිත කර නැත. එසේම යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලට ගැනීමට ප්‍රමාණවත් ණය මුදලක් නොලැබීම නිසා යන්ත්‍ර සූත්‍ර කිහිපයකින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමට සිදුවී

ඇත. උදාහරණ ලෙස දැව හා ගෘහ භාණ්ඩ ආශ්‍රිත කර්මාන්තයන්ගේ නියුක්ත වූවන්ට විවිධ විද්‍යුත් උපකරණ අවශ්‍ය වේ. ලී ගාන මැෂින්, ඩ්‍රිල්, රවුටර් මැෂින් ඒ අතර ප්‍රධාන ය. නමුත් ණය මුදල ප්‍රමාණවත් වී ඇත්තේ ලී ගාන යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා පමණි. නිෂ්පාදනයේ ගුණත්වය වැඩිකර ගැනීමට අවශ්‍ය අනෙකුත් යන්ත්‍ර ඔවුනට මිල දී ගැනීමට හැකි වී නැත. මෙම තත්ත්වය ග්‍රිල් හා වැල්ඩින් කර්මාන්ත, කඩදාසි හා මුද්‍රණ යන්ත්‍ර ආශ්‍රිත කර්මාන්තවල මෙන් ම ප්ලාස්ටික් හා රබර් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තවල බොහෝ සෙයින් දැකිය හැකි ය.

බැංකුවල විශ්වාසය දිනාගත් කුඩා කර්මාන්තකරුවන්ට වුව ද වැඩි ණය මුදලක් ලබා ගැනීමේ බාධක පවතී. බැංකු ක්‍රියාත්මක කරන විවිධ නීති රීති, පොලී අනුපාතය ඉන් ප්‍රධාන වේ. පුද්ගල ඇප හෝ දේපල ඇප පිළිබඳ ප්‍රශ්න, ණය ගෙවීමේ සහනයන් අඩුකම, ඉන් ප්‍රධාන වේ. විශේෂයෙන් ම සමෘද්ධි බැංකුව මෙන් ම සමුපකාර ග්‍රාමීය බැංකුවෙන් ණය ලබා ගන්නා කර්මාන්තකරුවන්ට එම බැංකුවල සාමාජිකත්වය ලැබූ ඇපකරුවන් ඉදිරිපත් කිරීමට සිදුවීම ගැටළුවක් වී ඇත. එසේම ණය වාරික ගෙවීම ප්‍රමාද වූ විට ඊට සහන නොලැබීම ඔවුන් මුහුණ දෙන ගැටළු වේ. මෙවැනි බාධක හේතුවෙන් කුඩා කර්මාන්තකරුවන්ට ලබා ගත හැකි ණය ප්‍රමාණවත් නොවීම නිසා ලබාගත් ණයවල සඵලතාව ද සීමාවී ඇත.

ණය මුදල් කර්මාන්තයේ දියුණුවට නොව වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කිරීම නිසා ණයවල සඵලතාව අඩු වී ඇත. ණය ලබාගත් කර්මාන්ත හිමියන් 14% ක් සිය ණය මුදල් කර්මාන්තයේ දියුණුවට යොදවා නොතිබුණු අතර සිය පෞද්ගලික අවශ්‍යතා සඳහා යොදවා තිබිණි. කර්මාන්තයක් පවත්වාගෙනයාම ණය ලබා ගැනීමට සුදුසුකමක් බැවින් කර්මාන්තයේ යම් කාර්යයක් නිම කිරීම සඳහා ණය ලබාගෙන සිය පෞද්ගලික කටයුතු සඳහා එකී ණය භාවිත කර ඇත. එබැවින් කර්මාන්තයේ දියුණුවක් සිදුවී නොමැත.

ණය ලබාගත් කර්මාන්තකරුවන් මුහුණ දෙන විවිධ ප්‍රශ්න ණයවල සඵලතාව සීමාවීමට හේතු වී තිබේ. කුඩා කර්මාන්ත හිමියන්ට සිය නිෂ්පාදන පුළුල් කිරීමේ දී ස්ථාවර හා විචල්‍ය යෙදවුම් සියල්ල එකවර වැඩි කර ගැනීමට සිදුවේ. නමුත් ඔවුනට ලබාගත හැකි ණය මුදල ඉතා අඩු බැවින් එකී ණය මුදලින් අත්‍යවශ්‍ය මූලික යෙදවුම් පමණක් වැඩිකර ගත්ත ද එය නිෂ්පාදනය පුළුල් කර ගැනිමට සක්‍රිය ලෙස දායක නොවේ. උදාහරණ ලෙස යම් කර්මාන්තහිමියෙකු ණය ලබාගෙන යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලට ගත්ත ද අමුද්‍රව්‍ය මිල දී ගැනීමට මූල්‍ය සම්පත් නොමැති බැවින් නිෂ්පාදනය වැඩි කර ගත නොහැකි වී ඇත. ණය ලබාගෙන ගොඩනැගිලි පරිමාව වැඩි කර ගත්ත ද යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීමට මුදල් නොමැති බැවින් නිෂ්පාදනය වැඩි වී නොමැත. මෙසේ කර්මාන්තයේ එක් ප්‍රශ්නයක් විසඳ ගැනීමට ණය මුදල් බලපෑවත් කර්මාන්තය මුහණ දෙන වෙනත් ප්‍රශ්න නිසා ණයවල සඵලතාව සීමා වී ඇත.

කුඩා කර්මාන්තහිමියන් මුහුණ දෙන වඩාත් වැදගත් ම ප්‍රශ්නය වන්නේ මූල්‍ය හිඟය වේ. කර්මාන්තයට අවශ්‍ය විවිධ වූ යෙදවුම් ලබා ගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැතිකම නියැදියේ කර්මාන්තවලින් 47% කට බලපා තිබේ. 06 වන වගුවට අනුව කර්මාන්තකරුවන් 37% කට මූල්‍ය හිඟය නැමැති ප්‍රශ්නය සාමාන්‍ය ලෙස බලපායි.

කුඩා කර්මාන්ත හිමියන් 29% කට අමුද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රශ්න වැදගත් වී ඇත. අමුද්‍රව්‍ය ප්‍රවාහන දුෂ්කරතා, ගුණාත්මක අමුද්‍රව්‍ය නොමැතිකම, අමුද්‍රව්‍ය මිල වැඩිවීම පාරිසරික හා රාජ්‍ය නීතිරීති හේතුවෙන් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ප්‍රශ්න පවතී. විශේෂයෙන් වැලි ප්‍රවාහන දුෂ්කරතා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදකයින්ට මුහුණපෑමට සිදුවන ගැටළුවකි. එසේම දැව කර්මාන්තකරුවන්ට දැව හිඟය හා දැව ප්‍රවාහන බාධක, කම්මල් කරුවන්ට අඟුරු නොමැතිකම ඔවුන්ට මුහුණ දීමට සිදුවී ඇති ප්‍රශ්නවලට උදාහරණ වේ.

### 6 වන වගුව: කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රශ්නවල බලපෑම

| | වැඩි ලෙස බලපා ඇත | සාමාන්‍ය ලෙස බලපා ඇත | අඩු ලෙස බලපා ඇත | බලපාන්නේ නැත |
|---|---|---|---|---|
| මූල්‍ය හිඟය | 47% | 37% | 12% | 04% |
| අමුද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රශ්න | 29% | 33% | 26% | 12% |
| වෙළඳපොල ප්‍රශ්න | 18% | 21% | 44% | 20% |
| ගොඩනැගිලි ආශ්‍රිත ප්‍රශ්න | 16% | 23% | 28% | 33% |
| යන්ත්‍ර සූත්‍ර ආශ්‍රිත ප්‍රශ්න | 14% | 26% | 30% | 40% |
| ශ්‍රමික ප්‍රශ්න | 07% | 13% | 28% | 52% |
| වෙනත් ප්‍රශ්න | 5% | 7% | 12% | 76% |

කුඩා කර්මාන්තහිමියන්ට මුහුණ පෑමට සිදුවන තවත් ප්‍රශ්නයක් වන්නේ නිෂ්පාදනය වර්ධනය කර ගත්ත ද ඒවා අලෙවි කර ගැනීමේ දුෂ්කරතාව යි. ඔවුන් ප්‍රදේශයේ අනෙකුත් නිෂ්පාදකයින් සමඟ මෙන් ම මහා පරිමාන නිෂ්පාදකයින් සමඟ ද තරඟ කළ යුතුය. ණය මුදලින් නිෂ්පාදනය වැඩි කර ගත්ත ද භාණ්ඩ අලෙවිය වැඩි කරගත නොහැකි වීම නිසා ණයවල සඵලතාව සීමාවේ.

නිෂ්පාදනය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර නොමැති වීම 14% කට ප්‍රධාන ගැටළුවක් වී ඇති දැඩි සේවක නීති රීති සහ පුහුණු ශ්‍රමය හිඟය ශ්‍රමය ආශ්‍රිත ප්‍රශ්න වේ. එකී ප්‍රශ්න කර්මාන්තකරුවන් 7% කට දැඩි ලෙස බලපා ඇත. මෙසේ කුඩා කර්මාන්තකරුවන් මුහුණ දෙන විවිධ ගැටළු හේතුවෙන් ණයවල සඵලතාව අඩු වී ඇත.

කුඩා කර්මාන්තහිමියන් ලබාගත් සූක්ෂම ණයවල සඵලතාව තවදුරටත් අඩුවීම කෙරෙහි කුඩා කර්මාන්තහිමියන්ගේ කළමනාකරණ දුර්වලතා හේතු වී තිබේ. විශේෂයෙන් ම විධිමත් සැලසුම් නොමැතිකම සහ නිෂ්පාදන පිරිවැය, ආදායම. වියදම හා ලාභය ආදිය පිළිබඳ සැලසුම් නොමැතිවීම හේතුවෙන් බොහෝ කර්මාන්තවල විවිධ ප්‍රශ්න ඇති වී ඇත. බොහෝ කර්මාන්ත කරුවන් ලබාගත් ණය මුදල් විධිමත් සැලසුමකට අනුව වැය කර නොමැති බව නිරීක්ෂණය වූ අතර නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් නොවීම, කලට වේලාවට වෙළඳපොලට භාණ්ඩ ඉදිරිපත් නොකිරීම වැනි ප්‍රශ්නවලට කර්මාන්ත මුහුණ දී ඇත. 80% කර්මාන්තවල

ප්‍රධාන කළමනාකරණ කාර්යයන් සියල්ල සිදු කරනු ලබන්නේ අයිතිකරු ය. එසේ ම කර්මාන්තයේ ප්‍රධාන වගකීම් බොහොමයක් කර්මාන්තය අයිතිකරු විසින් දරන බැවින් එකදු කාර්යයක්වත් නිවැරදි ව සිදු නොවන බව කර්මාන්ත නිරීක්ෂණයේ දී පැහැදිලි විය. එබැවින් කර්මාන්තයේ එක් එක් අංශවල කාර්යයන් පිළිබඳ විශේෂිකරණය කර්මාන්තහිමියා තුළ දියුණු නොවේ. ඔහු සතුව වගකීම් වැඩි බැවින් එකදු කටයුත්තක්වත් විධිමත් ව සිදුනොවන අතර සියලු කටයුතු අකාර්යක්ෂම ව සිදුවේ. එම නිසා ණය මුදල්වලින් ලබා ගත හැකි සඵලතාව සීමා වී ඇති බව නිරීක්ෂණය විය.

## නිගමන

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බොහෝ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, බැංකු හා මූල්‍ය අංශ කුඩා කර්මාන්ත සංවර්ධනයට විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබේ. විශේෂයෙන් කුඩා කර්මාන්ත සංවර්ධනය සඳහා මූල්‍ය සහය, තාක්ෂණික සහය, උපදේශක සේවා සැපයීම, පුහුණුව සපයීම වැනි විවිධ සහයන් සපයා ඇතත් ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත වර්ධනය වන්නේ ඉතා අඩු වේගයකිනි. එසේම කුඩා කර්මාන්ත ජාතික ආර්ථිකයේ 02% ට වඩා ඉතා අඩු වැදගත්කමක් දරනු ලබයි. මෙම අධ්‍යයනය මඟින් උත්සාහ දරණු ලැබුවේ කුඩා කර්මාන්ත සඳහා සපයන මූල්‍ය අනුග්‍රහයන් එම කර්මාන්තවල වර්ධනයට කෙසේ බලපා ඇද්ද යන්න ප්‍රායෝගික ව අධ්‍යයනය කිරිමට යි. එහි දී හඳුනාගත හැකි වැදගත් ලක්ෂණය ලෙස දැක්විය හැක්කේ කුඩා කර්මාන්ත වර්ධනයට රාජ්‍ය බැංකු පෞද්ගලික බැංකු හා සමුපකාර බැංකු සපයන සූක්ෂම මූල්‍ය ඉතා වැදගත් කාර්යභාරයක් සිදුකර ඇති බව යි.

විශේෂයෙන් කුඩා කර්මාන්තවල මූල්‍ය හිඟය නැමැති ප්‍රශ්නයට සූක්ෂම මූල්‍ය වැඩ සටහන් සතුටුදායක ලෙස විසඳුම් සපයා ඇති අතර කුඩා කර්මාන්ත වර්ධනයට එකී මූල්‍ය පහසුකම් වැඩි වශයෙන් බලපා තිබේ. සූක්ෂම මූල්‍ය පහසුකම් ලබා ගත් කර්මාන්ත හිමියන් එම මූල්‍ය වත්කම් උපයෝගී කර ගනිමින් කුඩා කර්මාන්තවල ස්ථාවර හා විචල්‍ය යෙදවුම් වැඩි කරගෙන ඇති

අතර එමඟින් කර්මාන්තවල නිමැවුම් වර්ධනය කර ගැනීමට සමත් වී ඇත. විශේෂයෙන් බොහෝ කුඩා කර්මාන්තවල ස්ථාවර යෙදවුම් වැඩිකර ගැනීමට සූක්ෂම මූල්‍ය හේතු වී ඇති අතර කර්මාන්තවල ගොඩනැඟිලි තත්ත්වය දියුණු කර ගැනීමට යන්ත්‍ර සූත්‍ර උපකරණ ප්‍රමාණය වැඩි කර ගැනීමට සූක්ෂම ණය වැඩි වශයෙන් දායක වී තිබේ. කර්මාන්තවල විචල්‍ය යෙදවුම් වැඩිකර ගැනීමට සූක්ෂම මුදල් දායක වී ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු වශයෙනි. ගොඩනැඟිලි තත්ත්වය දියුණු කර ගැනීමට සූක්ෂම මූල්‍ය ලබා ගත් කර්මාන්තවල නිෂ්පාදනය වැඩි වී ඇත්තේ කර්මාන්තයේ ගොඩනැඟිලි පරිමාව වැඩිකරගත් කර්මාන්තවල වන අතර කර්මාන්තයේ ගොඩනැඟිලිවල ඉඩකඩ වෙනස් නොවූ කර්මාන්තවල නිෂ්පාදනය වැඩි වී නොමැත. එසේම සූක්ෂම මූල්‍යවලින් යන්ත්‍ර සූත්‍ර උපකරණ අත්කර ගත් කර්මාන්ත හිමියන්ගේ නිෂ්පාදනය වැඩි වී ඇති අතර අමුද්‍රව්‍ය වැඩි කරගත් කර්මාන්තවල ද නිපැයුම වැඩි වීමට සූක්ෂම ණය බලපා තිබේ.

සූක්ෂම මූල්‍ය ලබා ගැනීමෙන් පසු බොහෝ කර්මාන්තවල නිෂ්පාදනය වැඩි වී ඇති අතර අළෙවිය මෙන් ම ලාභය ද වැඩි වී කර්මාන්ත වර්ධනය වී ඇත. නමුත් අතළොස්සක් වූ කර්මාන්ත ලබා ගත් සූක්ෂම මූල්‍ය නිවැරදි ව භාවිත නොකිරීම නිසා ණයවල සඵලතාව අඩුවී ඇත. සූක්ෂම මූල්‍ය කර්මාන්තයේ දියුණුව වඩා පෞද්ගලික අරමුණු ඉටුකර ගැනීමට යොදවා තිබීම එයට හේතුව යි. එසේම බැංකු අංශය මඟින් සපයන සූක්ෂම මූල්‍ය කර්මාන්තයේ අපේක්ෂිත ලෙස යෙදවුම් වැඩිකර ගැනීමට ප්‍රමාණවත් නොවන බැවින් සූක්ෂම මූල්‍යවල සඵලතාව සීමා වී ඇත. විවිධ කුඩා කර්මාන්තවල ස්වභාවය අනුව අවශ්‍ය වන අවම යෙදවුම් වෙනස්වන අතර කුඩා කර්මාන්තවලට අවශ්‍ය අවම යෙදවුම් වැඩිකර ගැනීමට සූක්ෂම ණය වශයෙන් සපයන මුදල් ප්‍රමාණවත් වී නැත.

කුඩා කර්මාන්තකරුවන් මුහුණ දෙන විවිධ ප්‍රශ්න හේතුවෙන් ණයවල සඵලතාව අඩු වී ඇති කර්මාන්තයේ කිසියම් ප්‍රශ්න කිහිපයක් විසඳ ගැනීමට සූක්ෂම ණය මුදල් ප්‍රමාණවත් වුවත් කර්මාන්තයේ සියලු ප්‍රශ්න විසඳ ගැනීමට සූක්ෂම ණය ප්‍රමාණවත් නැත. එබැවින් කුඩා කර්මාන්තහිමියන් බහුතරයක් මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය ලෙස මූල්‍ය හිඟය තවදුරටත් පවතී. එසේම අමුද්‍රව්‍ය ආශ්‍රිත ප්‍රශ්න වෙළඳපොල වර්ධනය කර ගැනීමේ බාධක, නීතිරීති

ආශ්‍රිත ප්‍රශ්න, ශ්‍රමික ප්‍රශ්න ආදිය හේතුවෙන් සූක්ෂම ණයවල සඵලතාව සීමා වී ඇත. විධිමත් සැලසුම් නොමැතිවීම කර්මාන්තයේ ප්‍රධාන වගකීම් කර්මාන්තහිමියා පමණක් සිදුකිරීම විධිමත් මූල්‍ය පරිපාලනයක් නොමැතිවීම ආදී කළමනාකරණ ගැටළු හේතුවෙන් ද ලබාගත් සූක්ෂම ණයවල සඵලතාව තවදුරටත් සීමා වී ඇත.

ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත වර්ධනය සඳහා තවදුරටත් සූක්ෂම ණය පහසුකම් කුඩා කර්මාන්තවලට සැපයිය යුතු අතර වඩා පහසුවෙන් වැඩි ණය මුදල් ප්‍රමාණයක් ලබා ගත හැකි පරිදි සූක්ෂම මූල්‍ය වැඩසටහන් සංශෝධනය කිරීමෙන් කුඩා කර්මාන්ත වර්ධනය කිරීමේ හැකියාව පවතී. එසේම කෙටිකාලීන මෙන් ම දිගු කාලීන ණය පහසුවෙන් කුඩා කර්මාන්තවලට ලබා ගැනීමට හැකිවන පරිදි ණය යෝජනා ක්‍රම සංශෝධනය විය යුතු අතර එමඟින් කුඩා කර්මාන්තකරුවන්ගේ යෙදවුම් ආශ්‍රිත ප්‍රශ්න විසඳ ගැනීමට අවශ්‍ය මූල්‍ය සම්පත් සැපයීම වැදගත් වේ. තව ද කුඩා කර්මාන්ත හිමියන් මුහුණ දෙන ගැටළු විසඳ ගැනීම සඳහා ඔවුනට පලපුරුදු නිළධාරීන් මඟින් උපදෙස් සැපයීම මෙන් ම ඔවුනගේ කළමනාකාර ගැටළු විසඳ ගැනීමට සහාය දැක්වීමෙන් ණයවල සඵලතාව වැඩිකර ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ:


Abeyratne, S. 2005, ***Small and Medium Enterprises in Sri Lanka: Integrating the SME sector with the Market***, Paper presented on the regional convention on policy reforms for SME development in SAARC Countries, 2-3 December 2005, Colombo.

Beck, T., Demirguc-Kunt, A., and Levine, R., 2003, ***SMEs, Growth, and Poverty: Cross Country Evidence***, Website: http://rru. Wordbank.org/Discussions/topics/topic26.aspx.

Central Bank of Sri Lanka, 1996, ***Annual Report 1995***, Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka, 1998. ' *Cottage and Small Scale Industry* '. *Economic*

*Progress of Independent Sri Lanka*, Central Bank Press, Colombo: 121 - 123.

Central Bank of Sri Lanka, 2005, *Annual Report 2004*, Central Bank of Sri Lanka, Colombo.

Central Bank of Sri Lanka, 2007, *Annual Report 2006*, Central Bank of Sri Lanka, Colombo.

Charitonenka .S. and Dulan de Silva, 2002, *Commercialization of Micro Finance*, Asian Development Bank, Manila, Philippines.

Jalal,R.S. 1991, *Industrial Entrepreneurship in Small Scale Industries*, Anmol Publications, New Delhi.

Rao,V.S.P. & Nagaia, D. 1991, *Small Industries Development in India*, Discovery Publishers Pvt. Ltd., New Delhi.

Reddy, R.J.P. 1991, *Problems and Development of Small Scale Industries in India*, Ashish Publishing House, New Delhi.

United Nations, 1985, *Small Industry Bulleting for Asia & Pacific*, United Nations Publication, New York.

United Nations Information Agency, 1994, *Economists Challenge claim Small Firms*, Economic Report, United Nations Publications, New York.

www.worldbank.org/research/msmedabase